# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

*(අධ්‍යාපන අමාත්‍යාංශය)*

NASTEC

## පුරප්පාඩු

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) විසින් පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**කළමනාකරණ සහකාර තනතුර: ශ්‍රේණිය III , MA – 1-2 (තාක්ෂණික නොවන - පුරප්පාඩු 03)**

**සුදුසුකම් :** අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ,ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සම්මාන සාමාර්ථ 4 ක් ඇතුළත්ව විෂයන් හයක් (06) එකවර සමත් වීම සහ අ.පො.ස (උ/පෙළ) විභාගයේදී විෂයන් තුනක් (03) සමත් වීම. (පොදු ප්‍රශ්න පත්‍රය හැර )

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : **රු:27,910 – 10x300 – 7x350 – 12x600 – 12x710 – 49, 080.**

මූලික වැටුප් පියවර : **රු:27,910**

වෙනත් ප්‍රතිලාභ :

- ජීවන වියදම් දීමනාව
- රජය විසින් අනුමත අනෙකුත් දීමනා
- සේවක අර්ථසාධක අරමුදල - ආයතනික දායකත්වය 12% හා සේවක දායකත්වය 8%
- සේවක භාරකාර අරමුදල - ආයතනික දායකත්වය 3%

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත විභාගයක් **සහ/හෝ** පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලැබූ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම්ව බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත.

**තනතුර සඳහා පැවරෙන ප්‍රධාන රාජකාරීන් :** වැඩිදුර තොරතුරු සඳහා www.nastec.gov.lk වෙත පිවිසෙන්න.

**අයදුම් කල යුතු ආකාරය :**

- ජීව දත්ත තොරතුරු ඇතුලත් අයදුම් පත්‍රය සහ අදාළ සහතික පත්‍රවල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු සහිතව **අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, 06 වන මහළ - D පර්යන්තය, දෙවන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට **2024.02.15** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇති අතර සුදුස්සන් තෝරා ගැනීමේ අවසාන තීරණය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව සතුවේ. කෙටි ලැයිස්තුගත කරනු ලැබූ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවා, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රාජ්‍ය ආයතනයන්හි සේවයෙහි නියුතු අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතු අතර, එහිදී ඔහු/ඇය තෝරා ගතහොත් සේවයෙන් මුදාහැරීමට හැකිද යන්න පිළිබඳ පැහැදිලි එකහතාව සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
06 වන මහළ - D පර්යන්තය
දෙවන අදියර, සෙත්සිරිපාය
බත්තරමුල්ල

දුරකථන : 011-2186711
වෙබ් අඩවිය : www.nastec.gov.lk